රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2002

මගේ අංකය:ආ/IV/2/2/1(2)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2002 අගෝස්තු මස 23 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 5 වගන්තිය සංශෝධනය කිරීම**
**වයස අවුරුදු 55 න් ඔබ්බට සේවය දීර්ඝ කිරීම**

1996.08.30 දිනැති 27/96 හා 1997.09.25 දිනැති 21/97 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් කරන ලද සංශෝධනයන්ද ඇතුළුව ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 5 වන වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය 2002 ජූලි මස 31 දින සිට බලපැවැත්වෙන පරිදි ආදේශ කරනු ලැබේ.

**02. 5 - විශ්‍රාම ගැන්වීම**

5 : 1 රාජ්‍ය නිලධාරියෙකුගේ විශ්‍රාම ගැන්වීම, රජයේ හා අධිකරණ නිලධාරීන්ගේ (විශ්‍රාම ගැන්වීමේ) ආඥා පනතද, ඒ යටතේ පනවන ලද ව්‍යවස්ථා ද යටතේ පාලනය වෙයි.

5 : 2 නිලධාරියෙකුගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවු.55 වේ.

5 : 3 පහත සඳහන් උප වගන්තිවල දක්වෙන විධිවිධානවලට යටත්ව වාර්ෂිකව සේවා දීර්ඝ කිරීමකින් තොරව අවු.57 දක්වා නිලධාරියෙකුට සේවයේ යෙදී සිටීමට හැකියාව ඇත.

5 : 3 : 1 වයස අවුරුදු 55 ඉක්මවූ නිලධාරියෙකුට තමන්ගේ අභිමතය පරිදි අවම වශයෙන් මාස තුනකට පෙර අදාළ පත්කිරීමේ බලධාරියාට දැනුම්දීමක් කර විශ්‍රාම යෑමට හැකියාව ඇත.

5 : 3 : 2 වයස අවුරුදු 55 ඉක්මවූ නිලධාරියෙකුගේ කාර්යක්ෂමතාවය හා සේවා තත්ත්වය සතුටුදයක නොවන බව පත් කිරීමේ බලධාරියා තීරණය කරන්නේ නම් මාස තුනක කල්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ අයිතිය පත්වීම් බලධාරියා සතුය.

5 : 4 සේවා දිගුව පිළිබඳව පත්වීම් බලධාරියා විසින් ලබාදී ඇති නියෝගයක් සම්බන්ධව එම නියෝගයට පාත්‍රවූ නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක සඳහන් කරුණු මත අදාළ වන පරිදි අභියාචන බලධාරීත්වය දරන අමාත්‍ය මණ්ඩලයට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එම නියෝගය ප්‍රතිශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමට හෝ බලය ඇත.

5 : 5 පහත සඳහන් විධිවිධානවලට යටත්ව සේවයේ අවශ්‍යතාවය මත රජයේ සේවකයෙකුගේ සේවය වයස අවුරුදු 57 සිට 60 දක්වා දීර්ඝ කිරීමේ අධිකාරි බලය පත්වීම් බලධරයා සතුය.

5 : 5 : 1 වයස අවුරුදු 57 න් පසු සේවය කිරීමට අදහස් කරන නිලධාරියෙකු තම සේවය දීර්ඝ කිරීම සඳහාවූ ඉල්ලුම් පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්, පත්වීම් බලධරයා වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. පළමු සේවය දීර්ඝ කිරීම සඳහා වූ ඉල්ලීම නිලධාරියාගේ වයස අවුරුදු 57 එළඹෙන දිනට මාස හයකට පෙරත්, ඉන් පසුව වයස අවුරුදු 60 දක්වා වන සේවා දීර්ඝ කිරීම් සඳහා වූ ඉල්ලීම් සේවා දිගුව ආරම්භ වන දිනට මාස තුනකට පෙරත් ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලීම් පිළිබඳව සලකා බලා පත්වීම් බලධරයා විසින් සේවා දිගුව ලබාදීම පිළිබඳව තීරණය කළ යුතුය.

5 : 5 :2 පත්වීම් බලධාරියා අමාත්‍ය මණ්ඩලය වන අවස්ථාවේදී 5 : 5 : 1 උප වගන්තියේ සඳහන් පරිදි නියමිත දිනට පෙර අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත සේවා දිගුව සඳහා වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. ලේකම්වරයා විසින් අදාල අමාත්‍යවරයා විමසා සේවා දිගුව ලබාදීම පිළිබඳව තීරණය කළ යුතුය. සේවා දිගුව ප්‍රතික්ෂේප කරන්නේ නම් එසේ කිරීමට තුඩුදුන් හේතු දක්වමින් අදල අමාත්‍යවරයා එම තීරණය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

5 : 5 : 3 නිලධාරියෙකුගේ සේවය දීර්ඝ කරන කාල සීමාව ඔහුට දැන්විය යුතු අතර, එක්වරකට වර්ෂයකට වඩා වැඩි කාලයකින් සේවය දීර්ඝ නොකළ යුතුය.

5 : 6 විනය නියෝගයක් නොවන්නේ නම්, නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවා කාලය, අවුරුදු දහයකට වඩා අඩු වන්නේ නම් අවුරුදු දහය සම්පූර්ණ වන දිනය හෝ නිලධාරියෙකුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනට පෙර ඉහත විධිවිධාන යටතේ නිලධාරියෙකු විශ්‍රාම ගැන්වීමට අදල බලධාරියා කටයුතු නොකළ යුතුය.

ඩී.ටා විමලසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.